


# මන්මෝහන් මහින්ද මල්ලිට ලියූ ලිපිය

මගේ චූටි මල්ලී වෙත,

මා ඔබට මේ ලිපිය ලියන්නේ බලවත් සිත් තැවුලෙනි. ඒ මල්ලී ගැනවත් මල්ලීගේ කට්ටිය එකතුවෙලා පාලනය කරන රට ගැනවත් නැත්නම් බෑන්චූන් ගසන රටවැසියා ගැනවත් කළකිරීමකින් නම් නොවෙයි. ඇත්තම කියනව නම් මල්ලියෙ මා මං ගැනම කළ කිරිලා. මං චෝගම් වලට අවොතින් මට මාවම නැතිවෙයි කියල මට ලොකු බයක් හිතට ආවා. ඒක තෙගුන දෙගුන වෙලා ආපහු මං හතරගුණයකින් වැඩි කරලා බැලුවත් මං දැක්කම උත්තරේ ජය ලලිතා. ඒකි නම් මහ පට්ට බඩුවක් මල්ලියේ. චිත්‍රපටිවල වගේම තමයි වැඩ. කොහොමත් ඉතින් අපිට දේශපාලනය කියන්නෙ ගස් වටේ දුව දුවා සිංදු කියන එකනෙ මල්ලියෙ ඒ මදිවට මහසෝනියා නංගිත් මට කිව්වෙම ඡන්දෙ දිනාගන්න බලපන්. ලංකාවට ගියාවගේ නෙවෙයි  නාඩු නැතිවුනොත් අපිට පාඩු තමයි සිං කියලා. මේ පාර දිනාගෙන රාහුල් කොල්ලව ඉහළට දාගෙන ඌට රට දෙන්න සෝනියා නංගිගෙ ලොකු කැමැත්තක් තියෙනවා හැබැයි ඌ නම් තාම ඕකේ එක දීලා නැහැ. ඌ දීපුදාට මට නැට්ට හකුළගෙන යන්න වෙන විත්තිය මං දන්නවා. ඇත්තම කියනවනම් මල්ලියේ මං මේ ලොකු රටක හිටියට උඹ තරම්වත් ගෑනියෙක් මිනිහෙක් කරන්න බලයක් නැති පියන් කෙනෙක් වගේ. උන් කියන කියන පදේට නටනව මිසක් මං වෙන මොනවා කියල කරන්නද බං. උඹ විශ්වාස කරහං මල්ලියේ උඹට මං මේක ඊමේල් නොකර ලියුමකින් ලිව්වෙ මටම කියල ඊමේල් ඇඩ්‍රස් එකක්වත් නැහැ ඕන්.

ඇත්තටම අපේ ලොකු අක්කා ඉන්නා කාලේ උඹලට හුඟාක් අරියාදු කළා කියල මං දන්නවා. ඒ ඔක්කොම වුනේ අර ඩිකී අයියා නිසානේ. ඒ යකාට යැංකි ඩිකී කිව්වේ නිකන්ද? ඒකා අපේ එකීට වැස්සි කියලා කියන්න පටන් ගත්තලුනෙ. ඒ මදිවට අපි රුසියන් කාරයො ළඟ වැඳ වැටිල ඉන්නකොට මූ ගියෙ නැතෑ ඇමරිකාව පැත්තට. ඒ කාලෙ අපිට ඒකලව පේන්න බැහැනෙ. ඒක නිසා තමයි අපේ ඉන්දිරා ලොකු අක්කා හුඟක්ම අමනාප වෙලා කොටින්ට එළකිරි පොවන්න ගත්තෙ. ඊට පස්සෙ අපි උඹලට පරිප්පු දාන්න පටන් ගත්ත. ඔය පරිප්පු දානකොට මං කිව්වා අපිටත් ඔය පරිප්පුවලින් බාගයක් කන්න වෙනවා. ඒක නිසා චපාති රොටි ටිකක්වත් දාමු කියලා. කොහෙද රජීව් මලයා ඒක ඇහුවෙ නැහැනේ චූටියො. මූ ප්‍රභාකොරන්ට එන්න කියල වෙඩි නොවදින ඇඳුමකුත් දීලා මහලොකු මුදලකුත් දුන්නනෙ. මං කිව්ව මූ ඕක ඇඳගෙන රජීව් මල්ලිට වෙඩි තිබ්බ දවසට කෝ මල්ලිට කබායක් කුඩු තමයි කියල. කබායක් තියා ඔලුවට තොප්පියක් වත් දාගන්න මොලයක් නැති එකාට මල්ලිලගෙ එකෙක් ඔලුව පැලෙන්න ගහපු දවසෙ මං හිතුවෙ එවෙලෙම බුදි තමයි කියලා. ඊට පස්සෙ අපේ එවුන් මල්ලිලගෙ රටට ගොඩ බැහැල පොල්තෙල් බීල එළුමස් කාල පිස්සු කෙලපු හැටි. පිස්සු හැදෙනවා මල්ලියෙ. උන්ට ප්‍රභාකරන්ගෙ මයිලක් හොල්ලන්ඩ බැරිව උන්ගෙ මයිල් හලාගත්ත. ඊට පස්සෙ රජීව් මල්ලි පුපුරල මරපු දවසෙ මං හරියට ඇඬුවා. සමහරවිට ඒ සතුටට වෙන්නැති. මං




සාමාන්‍යයෙන් දුකට අඬන්නෙ නැහැ මල්ලියේ. ඔහොම තමයි බං දේශයක් පාලනය කොරනකොට මං දැන් යැංකි සිං වෙලා උඹ මහින්ද චොං වෙලා දැන් බලහං ටෝනි ඇබොටය. උඹලට කොච්චර ආදරේද. මානව හිමිකං උඹල බලාගනිවී බෝටටුවලින් එන එවුන් ටික නතරකරල දියං කියල උඹලට බෝට්ටුත් දීල ගියේ. දැන් ඔසියන්ට තියෙන ලොකුම ප්‍රශ්නෙ බෝට්ටුවලින් එන එවුන්නෙ. ඇබොටට ඊළඟට දිනන්න උඹලට බෝට්ටු දෙකක් දුන්නට මක්වෙනවද මල්ලියෙ. අනෙක කැමරන්කාරය හිතන් ඉන්නෙ අපි කොහොම වෙතත් උඹල තාම යටත් පාත්තයො කියල. උන් ඒ කාලෙ කරපු අපරාධවල හැටියට උඹල තාමත් නිකං නිරපරාදයි වගේ මල්ලියෙ. අනෙක ඔය කක්කුස්සි වලවල් ගොඩදාගෙන කන පුරුද්දක් අපිට නෑනෙ. කෑව, රුන්න. එච්චරයි. ඕකා බලන්නෙත් දෙමළ ජන්ද ටිකට ඇහැගහගෙන උඹලට වැඩේ දෙන්න. අපි බලන්නෙත්...... සොරි මල්ලියෙ. අපි නැතිවුනත් අතාරින්න එපා දෙනු කැමරගෙ හොම්බට. අනෙක උඹට බලයෙ ඉන්න උන් කෑගහන එක හොඳයි මල්ලියෙ. බඩ පණුවො ටිකට කුකුල්ලු කෙටුවත් ඒ චන්ද ටිකත් මට ඕනෙ.

ඉතින් ඕව ගැන හිත හිත ඉන්නකොට ඒ රෙද්ද අස්සෙ මේ චෝගම් ආවා. ඔක්කොම එවුන් දැන් කියන්නෙ මං කොන්ද පණ නැති අගමැති කෙනෙක් කියල. පිට එවුන් කිව්වත් කමක් නැහැ ජයලලිතාත් කියන කොට යටි රැවුල්කොට නටනව මල්ලියෙ. මං උන් ගැන හිතලයි කොන්ද අතගගා ටර්බන් එක අස්සෙන් ඇඟිල්ල දාල ඔලුව කස කසා කරගන්න දෙයක් නැතිව පාඩුවෙ හිටියෙ. දැන් හිතෙනව මල්ලියෙ මට කොන්දක් තිබුණ නම් අම්මප රාවණ රජ්ජුරුවො වගේ තමිල්නාඩුව උඩින් දඬු මොනරෙන් ඇවිල්ල ඩුග්ගාල මත්තලෙන් බහින්න. කුරුල්ලො හැප්පුනත් ගානක් නැහැනෙ මල්ලියේ මගේ මොනර කුරුල්ලා ලොකුයිනේ.

දැන් අර උඹලගෙ තෙල් ළිඳේ තෙල් උනලද මල්ලියෙ. අනේ මන්දන්නෑ අපේ එවුන් දඟලනව උඹලට උදව් කරන්න. ඔන්න ඔහේ බොරතෙල් ටිකවත් අපිට දීලා දාපන් මල්ලියෙ. නැත්තං ආපහු අපේ එවුන් රට ජාතිය ආහාරයට අරන් නිදහසෙ සැතපෙනවනෙ. මේ කපේට රනිල් මල්ලියි උනුයි ඉන්නකං උඹ පරදින්නෙ නැහැ. රනිලත් නිල් බාං. සෝමවංශයට මං කියන්නෙ සෝමාරි වසන්ත කියල. මුං එකෙකුටවත් බැරිවුනානෙ උඹේ ඩයිකරපු එක රැවුල් ගහක් හොල්ලන්න.

උඹ ප්‍රේමදාස මලයා ගැන මොකද හිතන්නෙ මල්ලියෙ. අපිට නං ඒ මල්ලි ගැන හිතන්න දෙයක් තිබ්බෙම නැහැ. වැඩක් දෙන්න වෙලාවක් හොය හොය හිටියෙ, හොඳ වෙලාවට බාබුව සෙට් වුනේ. ප්‍රභාකරන් කොල්ලත් හොල්මන් වෙලා ඇහුවලු ප්‍රේමෙ මැරුවෙ කවුද කියලා. අපි උඹලට හුඟක් අරියාදු කළාට උඹල තෙම්පරාදු වෙලා බව මං දැනගත්තෙ මෑතකදි මල්ලියෙ. ඒ උඹල අපිටත් කොකන්පාල අර ඇස් පොඩි එවුන් අල්ල ගෙන යන ගමන ගැන දැකල. මට නම් ඔය ඇස් පොඩි එවුන් පෙන්නන්න බැහැ. උන් හිතන් ඉන්නෙ බජාර් එකේ අයිය උන් කියලා. චීන මහා ප්‍රාකාරෙ හැදුව කියල උන්ට පුළුවන්ද අයියල වෙන්න බජාර් එකේ කකුලක් වෙන්න. උඹල අපි කොච්චර ගහමරාගත්තත් එකට අඩිය පුඩිය ගහන කට්ටියනෙ මල්ලියෙ. මගේ හිතේ තිබුණු කේන්තිය ඊර්ෂියාව කොච්චරද කියනව නම් මල්ලි ළඟට ලංවෙලා පීත්ත පටි කපන ඇස් පොඩි එකා දැක්කම මගේ ඇඟෙ බලමාළු නටනව මල්ලියෙ. ආ අමතක වුනා උඹලගෙ බෝඩර් එකට පැනලා බලමාළු අල්ලපු දෙමළු ටික ඔන්න ඔහෙ දීල දාපන් මල්ලියේ ඊළඟට එන ප්‍රභාකොරන් මරන්න එහෙම අපි උදව් කරන්නෙ නැහැ ඕන්. අපි උඹලට බුදුහාමුදුරුවො දුන්නා. විජය දුන්නා. රාගධාරී සංගීතය දුන්නා. බොලිවුඩ් දුන්නා. පරිප්පු දුන්නා.එකී නොකී මෙකී සැමම දුන්නා. දෙන්න බැරිව ගියේ පිවිතුරු ආලය පමණයි ඒ වුනාට කුවේණි නගාගෙ කාලෙ ඉඳන් උඹලට අපි අරියාදු කළාට ආදරේ අඩුවක් නැහැ මල්ලියෙ. ආ ඒක නෙවෙයි. මොකක්ද බං මල්ලියෙ උඹ කියල තියෙන්නෙ යුධ අපරාධ කරපු එවුන්ට තරාතිරම නොබල දඬුවම් දෙනවා කියල. පිස්සු නම් කෙළින්න එපා මල්ලියෙ. අපරාධ නොකර යුද්ධ කරන්න පුළුවන්ද. අනෙක එහෙම වුනොත් උඹලට අපිටනෙ මුලින්ම දඬුවම් කරගන්න වෙන්නෙ. මං දන්නවා උඹ ඕක කිව්වෙ චෝගම් ත්‍රිල් එකෙන් ආපු ජොලියට කියල. ඒ වුනාට ඕවට අපේ ජයලලිතා නංගිව නම් තම්බන්න බැහැ. උන් කොහොම හරි හදන්නෙ වෙනම රටක් හදන්න. එහෙම වුනොත් නම් තමිල්නාඩුව නාඩු හාල්වගේ අපෙන් තැම්බිල යනව මල්ලියෙ. අපි කලාපයේ බලවතා වෙන්න වලිකන වෙලාවෙ වෙච්ච අත්වැරද්දට සමාවෙයන් මල්ලියෙ. මං දන්නවා මං නාවට ඕනම ලෙඩකට දුකකට උඹ මගේ රටට ගොඩ බැහැල මාව හම්බවෙලා සාස්තරයකුත් බලාගෙන යන්න එනවා කියල. ඉතින් දැන් හුඟක් ලිව්වා. 2014ත් ආවා. උඹලගෙ රටේ වගේම අපේ රටෙත් රතිඤ්ඤා ගොඩක් පුපුරයි. ඒ අවුරුද්දෙ මං දිනපු හැටිය ජයලලිතා නංගිට ඕන මඟුලක් කරගන්න කියල මං උඹව බලල යන්න එන්නම් මල්ලියෙ. මං නාවත් උඹ වරෙන්කො. අනික උඹලට අපිට චෝගම් දුන්නෙ සුද්දනෙ. අපි චුවින්ගම් වගේ හැමදාම හැපුවට ඕක ගිලින්න බැහැ මල්ලියෙ. අනෙක අපේ හියුමන් රයිට් ගැන කතාකරන්නෙත් උන්නෙ. තමිල්නාඩුවෙ දෙමළු ටික හිතන් හිටියෙ මං නාවොත් ඕක චකබිලාස් වෙලා නිකන් පපඩම් වගේ වෙයි කියල. උඹල ඕක කරපු ලස්සන දැකල මට හිතෙනව මලේ අපි මොන සෙප්පඩයොද කියල. උඹලගෙ චෝගම නොදැකපු මේ දෑස් මක්කටද මල්ලියෙ. බිලියන දෙකක් තුනක් ගහ ගත්තත් උඹල වැඩේ නියමෙට කළා මලේ.

ආ ඒක නෙමෙයි මං ඇහැව්වා අර සිංදුව පිප්සිය කියන සිංදුව. ලංකාවෙ එහෙම වෙන්නෙ නැහැ. ඔක්කොම වෙන්නෙ ඉංදියාවෙ, ඇමෙරිකාවෙ සිංදුව. ඇත්තටම මලේ එහෙමද වෙන්නෙ. ඒ සිංදුව මරු. ෂෝක් මලේ. මං නවත්තනව කියල ආපහු ලියනව. ඉතින් මලේ අපිත් එක්ක ඉඳල ඔළුව උස්සගන්න බලපන්.නැත්තං ඔය ඩයි ගාන ලව් රැවුල් කොට පිරුණ මුහුණ චිනා වගේ වෙයි. ඔය ඇස් පොඩි එවුන් ඇස්වලින් හිනාවුනාට අපි වගේ ගුද මාර්ගයේ රත්තරන් හංගගෙන පනින එවුන් නෙමෙයි. උන් ඒවා හංග ගන්නෙ ලේ වල. හොයාගන්ඩම බැහැ. දැන් මං වටේම හතුරො. මට  උඹත් හතුරු කරගෙන බැහැ මලේ. හදිසියකට බ්ලේඩ් තලේකටවත් ඉන්නෙ උඹ විතරයි. උඹට මං. මං උඹට. නාවට සොරි. ආවා වගේ තමයි. 2014 උඹලගෙ රට අපේ රටේ බඩුවලින්ම උතුරන්න ඕනෙ. එහෙම වුනොත් මං කිරියි පැණියි නිකන් දෙන්නං. උඹට දිවංගත සායිබාබාගේ පිහිටයි.

චෝවෙන් පසු මිල වැඩිවෙලා මිල නගින්නෙ ඔහෙ විතරද
ගහපු කොමිස් වැඩිවුනාට කපුටො ඉන්නෙ ඔහෙ විතරද
කැමරන්ලා වලි දැම්මට අපිට ඉන්නෙ උන් විතරද
කිසිදේකට මං නාවට උඹට ඉන්නෙ මං විතරද

මීට හිතවත්
**චෝගම් වෙනුවෙන් හොඳම බයිලාව ගැයූ සිං**





## LAND FOR SALE

### IN SRI LANKA
### ETHULKOTTE
### MALIGAWA ROAD

50 meters to Ethulkotte – Nugegoda Road
Ideal residential property
20 perches – Rs: 2 million per perch
Price negotiable

**Contact : 0448 756 944**
**02 9476 3606**

## සියලුම ජෝතිශ්‍ය කටයුතු

දෙස් විදෙස් කේන්ද්‍ර සෑදීම, පලාපල ලියා දීම,
කරදර ගැටළු වලට පිළියම්, අපල වලට පිළියම් හා වාර්තා......
විවාහ සිහුම්, පොරොන්දම් ගැලපීම, දෝෂ විමසීම හා මඟහරවා ගැනීමට උපදෙස්.....
මංගල, මල්වර, නිවාස, විහාග, අකුරු කරවීමේ ශුභ නැකත්.......
නමට අකුරු, නම් තැබීම....
දල, සිරිපති, ක්‍රිෂ්ණමූර්ති හෝ ඕනෑම ක්‍රමයකට කර දෙන්නෙමු.

*ඊ මේල්, දුරකතන මගින් විශේෂ කඩිනම් සේවා......*

රහස්‍යභාවය සුරකිමු

**සුබෝධා ජෝතිශ්‍ය සේවය**

www.wix.com/eppingvic/subodhabeauty
0433536097 subodhaastro@yahoo.com.au